**ශීර්ෂය 013 - ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය - 013 ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූනි 26 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කළ යුතු වුවත්, පුනරාවර්තන වැය විෂයයන් 06 ක එකතුව රු.6,674,000 ක ප්‍රතිපාදන වෙනත් පුනරාවර්තන වැය විෂයයන් 10 කට මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කරගෙන තිබුණි. | 2022 වර්ෂයේ පැවති අධික උද්ධමනය, විදුලිය කප්පාදුව නිසා ජෙනරේටර් වලට ඉන්ධන ලබා ගැනීමට සිදුවීම, අරගලය සිදුවූ අවස්ථාවලදී නිලධාරීන් යෙදවීමට සිදුවීම ආදී කරුණු නිසා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීමත් වියදම් පාලනය හා අත්‍යාවශ්‍ය නොවන රාජකාරි නැවැත්වීමට ලද උපදෙස් මත ප්‍රතිපාදන ඉතිරිවීමත් ඉතාමත් හදිසි හා කළයුතුම රාජකාරි සඳහා පවා අග්‍රිම මුදල් සීමාකිරීමත් මෙයට හේතු විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කළ යුතු වේ. |

## 2.2 බැරකම් හා බැඳීම් වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ)** බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබූ වැය විෂයයන් 4 කට අදාල එකතුව රු. 3,038,056 ක බැරකම් සඳහා 2023 වර්ෂයේදී ගෙවීම් කර තිබුණි. | බැරකම් ලේඛනය පවත්වාගෙන යාමේ අඩුපාඩු පවතින බව පිළිගනිමි. ඉදිරියේදී බැරකම් ලේඛනය නිවැරදි ආකාරයට සකස් කිරීම සඳහා අදාළ නිලධාරීන් දැනුවත් කළ අතර, යාවත්කාලීන කිරීමට සටහන් කර ගන්නා ලදී. | වර්ෂයට අදාළ සියළුම බැරකම් ඇතුලත්ව බැරකම් ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| **(ආ)** මුදල් රෙගුලාසි 94(1) ට පටහැනිව, ඉහත සඳහන් වැය විෂයයන් 4න් වැය විෂයයන් 2 ක පිළිවෙලින් රු.4,956,000 ක් හා රු.40,700,000 ක්වූ ශුද්ධ ප්‍රතිපාදනය ඉක්මවා රු.111,700 ක හා රු.89,115 ක බැරකම් වලට එළඹ තිබුණි. | වර්ෂය තුළ දුරකථන ගාස්තු වරින්වර ඉහළ යාම හා වර්ෂය මැද බදු මුදල් සංශෝධනය වීම මෙයට හේතු විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කලයුතු වේ. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **විගණන නිරීක්ෂණය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16.2 වගන්තිය | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කළ කාර්යසාධන වාර්තාවේ කෙටුම්පත මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි | 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව සකස් කරමින් පවතී. | ටෙට ජාතික විගණන පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ | | | |
| (i) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන චක්‍රලේඛය | | | |
| • 11.1.6 වගන්තිය | සෑම මුදල් වර්ෂයකම ජුනි 15 දිනට පෙර පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් කොමිෂන් සභාව විසින් 2022 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2023 මැයි 29 දින වන විටත් ඉදිරිපත් කර නොතිබූ අතර 2021 වර්ෂය සඳහා වූ | 2021 වර්ෂයේ ප්‍රාදේශීය කාර්යාල සියල්ල භාණ්ඩ සමීක්ෂණය අවසන් කර වාර්තා මේ සමඟ ඉදිරිපත් කරන අතර ප්‍රධාන කාර්යාලයේ භාණ්ඩ සමීක්ෂණය අවසන් කරමින් පවතී. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | වාර්තාවෙන් කොටසක් මාස 06 ක පමණ ප්‍රමාදයක් සහිතව 2022 දෙසැම්බර් 09 දිනදී විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි. එම වාර්තාවේ කල්මුනේ ප්‍රාදේශීය කාර්යාලය හා නුවරඑළිය, මන්නාරම, පුත්තලම යන උපකාර්යාලවල භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඇතුළත් වී නොතිබුණි. | | |
| • 11.1.5 වගන්තිය | උක්ත චක්‍රලේඛය ප්‍රකාරව සෑම මුදල් වර්ෂයකම අප්‍රේල් 30 දිනට පෙර පොදු 47 වාර්තාව අනුව විනාශ කළ යුතු, අලුත්වැඩියා කළ යුතු, විකිණිය යුතු හා වෙනත් ආයතන වලට පැවරිය හැකි භාණ්ඩ සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වුවත් එලෙස කටයුතු කර නොතිබුණි. | 2020 වර්ෂයේ ප්‍රධාන කාර්යාලයේ පොදු 47 න් ඉවත් කිරීම සඳහා යෝජිත භාණ්ඩ පුත්තලම ගොවිජන සේවා කාර්යාලය වෙත මාරු කරන ලදී. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ii) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන චක්‍රලේඛයේ 12.1 ඡේදය | මුදල් වර්ෂය අවසන් වී දින 150ක් ගතවීමට පෙර වාර්ෂික කාර්යසාධන වාර්තාව භාෂාත්‍රයෙන් සකස් කර පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට ඉදිරිපත් කලයුතු වුවත් 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2023 මැයි 29 දින වනවිටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාවේ දෙමළ පිටපත පරික්ෂා කර මුද්‍රණයට ලබා දීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී. 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව සකස් කරමින් පවතී. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| **(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | |
| (i) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛය | අභ්‍යන්තර පාලනයක් පවත්වාගෙන යාම වෙනුවෙන් එක් එක් ආයතන නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම පැමිණීමේ ලේඛණයක අත්සන් තැබීම මගින් | කොමිෂන් සභාවේ නිලධාරීන් දෙදෙනෙකුගේ ඇඟිලි සළකුණ, ඇඟිලි සළකුණු යන්ත්‍රයට සටහන් තැබීම සඳහා | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | සනාථ කර ගන්නේ නම් එය ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කිරීමේ ක්‍රමයට අමතරව කළ යුතු බව දැක්වෙතත් කොමිෂන් සභාවේ නිලධාරීන් දෙදෙනෙකු ඇඟිලි සලකුණු යන්ත්‍රයේ පැමිණීම පිටවීම සටහන් කර නොතිබුණි. | බොහෝ වේලාවක් උත්සාහ කළ යුතුව ඇත. මෙම තාක්ෂණික දෝෂය හේතුවෙන් පැමිණීමේ ලේඛනයේ අත්සන් තබනු ලබයි. | |
| (ii) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛය | 2022 වර්ෂය වෙනුවෙන් කොමිෂන් සභාව විසින් විගණනය වෙත ඉදිරිපත් කර තිබූ මානව සම්පත් සංවර්ධන සැලැස්ම චක්‍රලේඛයේ සඳහන් ආකෘතිය ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි. | අදාළ චක්‍රලේඛයේ ගැටලු සහගත තත්ත්වයන් පැනනැඟී අවස්ථාවේ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ - පාලන හා මුදල් විසින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් විමසීම් කළ විට එය ක්‍රියාත්මක වන තත්ත්වයේ නොපවතින බවද එය පිළියෙල කිරීමට කිසිදු උපදේශනයක් ලැබී නොමැති බවද ප්‍රකාශ කර ඇත. | මානව සම්පත් සංවර්ධන සැලැස්ම චක්‍රලේඛයේ සඳහන් ආකෘතිය ප්‍රකාරව පිළියෙල කළ යුතු වේ. |
| (ඇ) | 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය | අනවශ්‍ය වියදම් ලෙස සැලකිය හැකි සියළු වියදම් සඳහා රජයේ මුදල් භාවිතා නොකරන ලෙසට උපදෙස් දී තිබුණද 2020 හා 2021 වර්ෂවල වාර්ෂික වාර්තා සකස් කිරීම සඳහා කොමිෂන් සභාවෙන් පරිබාහිර අයෙකුට සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.210,000 ක් ගෙවා තිබුණි. | වාර්ෂික වාර්තා සකස් කිරීම සඳහා පළපුරුදු නිලධාරියෙකු නොමැති බැවින් චක්‍රලේඛයේ සඳහන් උපදෙස් වලට පටහැනි නොවී, බාහිර පුද්ගලයකුගේ දැනුම ලබා ගැනීමට සිදුවී ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොමිෂන් සභාව විසින් 2022 ජනවාරි 01 දින සිට 2022 නොවැම්බර් 29 දින දක්වා වූ කාල සීමාව තුල රජයේ ආයතන වෙත නිර්දේශ 72 ක් ලබා දී තිබුණ ද ඉන් නිර්දේශ 66 ක් එනම් සියයට 91 ක් සහ 2021 වර්ෂය තුලදී ලබා දී තිබූ නිර්දේශ 88න් නිර්දේශ 59 ක් එනම් සියයට 67 ක් විගණන දිනය වූ 2022 දෙසැම්බර් 15 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | එකී නිර්දේශ ක්‍රියාත්මක නොකිරීමේ වගකීම අදාළ වගඋත්තරකාර ආයතන වෙත පැවරෙන අතර, කොමිෂන් සභාව විසින් පනතේ ප්‍රතිපාදන අනුව නිර්දේශ ලබාදීම තුළින් තම වගකීම ඉටු කර ඇත. නමුත් එකී නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව අවශ්‍ය මැදිහත්වීම් සිදු කරනු ලබයි. | ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මකවීම පිළිබඳ අවධානය යොමු කළ යුතුය. |
| (ආ) | 2022 නොවැම්බර් 30 දිනට කොමිෂන් සභාව සතුව අවසන් නොවූ ලිපිගොනු 10,029 ක් පැවති අතර ඉන් සියයට 13 ක් එනම් 1,340 ක් අවුරුදු 3ට වඩා වැඩි කාලයක සිට පැවත එන ලිපිගොනු වූ අතර ලිපිගොනු 109 ක් අවු 10 ට වඩා පැරණි ලිපිගොනු විය. | කොවිඩ් වසංගතය හේතුවෙන් පරීක්ෂණ කටයුතු අතපසුවීම, සේවය සඳහා සිටින නිලධාරීන් හදිසි පැමිණිලි විභාග කිරීම හා මානව හිමිකම් කඩවීම් සිදුවන ස්ථාන කරා යොමු කිරීමට සිදුවීමත් අවුරුදු 10කට වඩා වැඩි ලිපිගොනු 109 පැවතීමට අධිකරණයේ පවතින නඩු අවසන් වීමෙන් පසුව පැමිණිලිකරුවන්ගේ ඉල්ලීම මත නැවත විභාගයට ගැනීම, අදාළ වගඋත්තරකාර පාර්ශවයන් ස්ථාන මාරු ලබා වෙනත් ස්ථාන වලට යාම හා ප්‍රධාන වශයෙන් අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පැවතීම හේතු වී ඇත. | පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කිරීමට උපරිමව කටයුතු කළ යුතු වේ. |

## 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කොමිෂන් සභාව සතු ඡායා පිටපත් යන්ත්‍ර 3 ක් භාවිතයකින් තොරව නිශ්කාර්යව පැවති අතර ඉන් යන්ත්‍ර 2 ක් 2019 වර්ෂයේ සිටම නිශ්කාර්යව පැවතුණි. | මෙම ඡායාපිටපත් යන්ත්‍ර 2007, 2010, 2012 යන වර්ෂවල මිලදී ගත් ඒවා බැවින් ඒවා අලුත්වැඩියා කිරීමට අවශ්‍ය අමතර කොටස් නොමැති බව නියෝජිත ආයතනය විසින් දන්වා ඇත. | මෙම වත්කම් සම්බන්ධයෙන් සුදුසු කටයුතු කළ යුතු වේ. |

## 3.3 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කොමිෂන් සභාව විසින් 2004 ජනවාරි 01 දිනෙන් පසු අත්පත් කර ගත් වත්කම් පමණක් මූලා නොවන වත්කම් ප්‍රකාශයේ ඇතුළත් කර තිබුණු අතර 2004 වර්ෂයට පෙර පැවති වත්කම් හඳුනාගෙන නොතිබුණි. | තක්සේරු මණ්ඩලයක් පත්කර සියලුම භාණ්ඩ තක්සේරු කිරීමට කටයුතු කර ඇති අතර, 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය අවසන් කළ පසු සමීක්ෂණ කටයුතු ආරම්භ කිරීමට නියමිතය. | සභාව සතු සියළුම වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. |

# 4. යහපාලනය

## 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා සුදුසු විගණකවරයකු පත් කරනු ලැබිය යුතු වුවත්, 2017 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අභ්‍යන්තර විගණකවරයකු පත් කර අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි. | මාණ්ඩලික තීරණයක් මත මීට පෙර අභ්‍යන්තර බඳවා ගැනීමට ඉල්ලුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පවත්වා තෝරාගත් කොමිෂන් සභාවේ නිලධාරියෙකුට දැනට රාජකාරි පවරමින් පවතී. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක කළ යුතු වේ. |

## 4.2 විගණන හා කළමනාකරණ කමිටුව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තිය ප්‍රකාරව සෑම අස්ථිත්වයක් සඳහාම විගණන හා කළමනාකරණ කමිටුවක් තිබිය යුතු වුවත්, 2017 වර්ෂයේ සිට කොමිෂන් සභාවේ විගණන හා කළමනාකරණ කමිටුව පවත්වා නොතිබුණි. | අභ්‍යන්තර විගණන තනතුර පුරප්පාඩුව පැවතීමත් අදාළ මාණ්ඩලික නිලධාරීන් ප්‍රමාණවත් නොවීමත් මත විගණන හා කළමනාකරණ කමිටුව පත් කර නොමැත. කෙසේ වෙතත් පත් කළ විගණකවරයාට දැනට ලබාදී ඇති උපදෙස් අනුව ඉදිරි කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය පියවර ගනිමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 13.2 ඡේදය ප්‍රකාරව සෑම මූලික විමර්ශනයක්ම නොපමාව නිම කිරීමට අදාළ සෑම පාර්ශවයක්ම නිරන්තරයෙන්ම වගබලාගත යුතු අතර එහි 22.1 වගන්තිය ප්‍රකාරව විධිමත් විනය පරීක්ෂණයක් අනවශ්‍ය ලෙස ප්‍රමාද වන බව පෙනී යන්නේ නම්, එය වැලැක්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීම විනය බලධාරයාගේ වගකීම වුවත් කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරිනියක් සම්බන්ධයෙන් 2017 මාර්තු ආරම්භ කර තිබූ මූලික පරීක්ෂණය අවසන් කිරීම සඳහා වසරකට වඩා වැඩි කාලයක් සහ විධිමත් විනය පරීක්ෂණ සඳහා වසර 04 කට අධික කාලයක් ගතවී තිබුණි. එසේම කොමිෂන් සභාවේ හිටපු | මෙම පරීක්ෂණය අවසන් කර අවසන් වාර්තාව ලැබී ඇත. ඒ අනුව චූදිත නිලධාරිණිය අනිවාර්යය විශ්‍රාම ගැන්වීමේ විනය නියෝගය නිකුත් කර ඇත. | විනය පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | ලේකම්වරිය සම්බන්ධයෙන් වූ විධිමත් විනය පරීක්ෂණය සඳහා වසර 3කට ආසන්න කාලයක් ගතවී තිබුණි. | | |
| (ආ) | විමර්ශණ නිලධාරිනිය සම්බන්ධයෙන් වූ මූලික විමර්ශනයෙන් පසු 2018 සැප්තැම්බර් 10 දින චෝදනා පත්‍රයක් නිකුත් කර තිබුණු අතර 2018 දෙසැම්බර් 18 දින පිළිතුරු ලැබී තිබුණි. විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීම සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය මත 2018 ජූලි 12 දින විමර්ශන නිලධාරියකු තෝරාගෙන තිබුණු අතර ඒ සඳහා පත්වීම් ලිපියක් 2018 ජූලි 31 දින යවා තිබුණි. ඒ අනුව ආයතන සංග්‍රහයේ ඉහත පරිච්ඡේදයේ 15.9 ඡේදයට පටහැනිව කොමිෂන් සභාව විසින් චූදිත නිලධාරිනියට චෝදනා පත්‍රය නිකුත් කිරීමට පෙර විධිමත් විනය පරීක්ෂණය සඳහා වූ විමර්ශන නිලධාරියා පත් කර තිබුණි. | මෙම පරීක්ෂණය අවසන් කර අවසන් වාර්තාව ලැබී ඇත. ඒ අනුව චූදිත නිලධාරිණිය අනිවාර්යය විශ්‍රාම ගැන්වීමේ විනය නියෝගය නිකුත් කර ඇත. | ආයතන සංග්‍රහයේ ඉහත පරිච්ඡේදයේ 15.9 ඡේදයට අනුගත විය යුතු වේ. |
| (ඇ) | 2022 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 25 ක්, තෘතීයික මට්ටමේ තනතුරු 36 ක්, ද්විතියික මට්ටමේ තනතුරු 35 ක පුරප්පාඩු පැවතුන අතර ප්‍රාථමික මට්ටමේ තනතුරු 01 ක අතිරික්තයක් පැවතුණි. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 05 ක් සඳහා වැඩබැලීමේ පදනම, කොන්ත්‍රාත් පදනම හා ද්වීතියන පදනම මත නිලධාරීන් පත් කර ඇත. තෘතීයික මට්ටමේ එක් තනතුරක් සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරියකු බඳවාගෙන ඇති අතර අනෙක් පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. | කාර්යසාධනයට අහිතකර ලෙස බලපාන අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. |